චක්‍රලේඛ අංක 93/10

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ශාඛාව,
මගේ අංකය: 2/ක්‍රීවිබා/4/4/93
"ඉසුරුපාය",
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ,
බත්තරමුල්ල.

1993 මැයි මස 31 වැනි දින.

පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත,

## සමස්ත ලංකා පාසල් සංගීත හා නාට්‍ය තරගය - 1993
## සමස්ත ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 1993

පසුගිය වර්ෂවලදී මෙන් මෙවර ද ඉහත සඳහන් තරග පැවැත්වීමට විධි විධාන යොදා ගෙන යනු ලැබේ.

02. තරගඃ-

2.01 මෙම තරග පහත සඳහන් පරිදි කොටස් 4 කට බෙදා ඇත.

| | | |
|---|---|---|
| ප්‍රාථමික | - | 1 වසර සිට 5 වසර තෙක් |
| කණිෂ්ඨ | - | 6 වසර සිට 8 වසර තෙක් |
| ජ්‍යෙෂ්ඨ | - | 9 වසර සිට 13 වසර තෙක් |
| විවෘත | - | 1 වසර සිට 13 වසර තෙක් |

ඒකල හා යුගල තරගවලදී පමණක් ජ්‍යෙෂ්ඨ අංශය

(අ) 9 වසර සිට 11 වසර තෙක් හා
(ආ) 12 වසර සිට 13 වසර තෙක් යනුවෙන් උප කොටස් 2 කට බෙදනු ලැබේ.

2.02 රජයේ, පෞද්ගලික (රජයට පවරා ගැනීමට පෙර උපකෘත) සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පාසල්වල සිසුන්ට මෙම තරග සඳහා ඉදිරිපත් විය හැකිය.

2.03 2.02 හි සඳහන් පාසල්වල ගුරුවරුන්ට (අභ්‍යාස ලාභී ගුරුවරු ඇතුළුව) සහ සිසුන්ට ද, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය ඇතිව එම පාසල්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්ට ද පසුබිම් වාදනයේදී සහභාගී විය හැකිය.

2.04 ශිෂ්‍යයන්ට තරගවලට සහභාගී විය හැක්කේ 2.01 හි සඳහන් අදාළ කණ්ඩායම් යටතේ පමණි.

2.05 4.01 සිට 4.09 දක්වා තරග ශීර්ෂ සඳහා පමණක් විද්‍යුත් සංගීත භාණ්ඩ උපයෝගී කර ගත හැකි අතර අනෙකුත් ප්‍රසංග අංග සඳහා භාවිතා කළ නොහැකිය.

2.06 සමස්ත ලංකා තරගයේදී එක් එක් තරග ශීර්ෂයට සහභාගී වන්නන්ගේ නාම ලේඛනයන් පහත සඳහන ආකෘතිය අනුවම පිළියෙල කර ගත යුතුය.

## සමස්ත ලංකා පාසල් සංගීත හා නාට්‍ය තරගය - 1993
## සමස්ත ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 1993

1. විද්‍යාලයේ නම:-

2. විද්‍යාලයේ ලිපිනය:-

3. විද්‍යාලය අයත්වන පළාත් අධ්‍යාපන ප්‍රදේශය :-

4. තේරීපත් වන ප්‍රසංග (චක්‍ර ලේඛන අනුව සටහන් කරන්න)

5. තරගයට සහභාගී වන සිසුන්ගේ නාම ලේඛනය:-
(ගැහැණු /පිරිමි බව සඳහන් කරන්න)

| නම | ගැහැණු/පිරිමි | වයස | අත්සන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

6. සිසුන් භාරව පැමිණෙන සිසුන්ගේ/ගුරුභවතුන්ගේ නම්:-
(ගුරුවරයෙක්ද/සිසුවෙක් ද යන වග සඳහන් කරන්න)

7. තරගයට සහාය වන්නන්ගේ නම හා විද්‍යාලය:-

8. ප්‍රසංග පුහුණු කළ ගුරුවරයාගේ/ගුරුවරියගේ/ශිෂ්‍යාගේ/ශිෂ්‍යාවගේ නම:-
(ගුරුවරයෙක්ද සිසුවෙක්ද යන වග සඳහන් කරන්න)

.......................................................
විදුහල්පති
නිල මුද්‍රාව.

3.00 තරඟ ශීර්ෂ සඳහා අදාළ විස්තර i වැනි, ii වැනි උප ලේඛනවල ඇතුලත්වේ.

i වැනි උපලේඛනය - සමස්ත ලංකා පාසල් සංගීත හා නාට්‍ය තරගය
ii වැනි උපලේඛනය - සමස්ත ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය

4.00 ජය සංකේත හා සහතික පත්:-

අවසාන තරඟයේ දී පළමුවැනි, දෙවැනි, තුන්වැනි ස්ථාන තුන දිනා ගන්නා අයට සහතික පත් පිරිනමනු ලැබේ. මීට අමතරව ඒකල හා යුගල තරග ශීර්ෂවලින් පළමුවැනි ස්ථාන දිනා ගන්නා අයට පදක්කම් ද, සමූහ තරගවලින් පළමුවැනි ස්ථාන දිනා ගන්නා කණ්ඩායම්වලට ජය සංකේත ද පිරිනමනු ලැබේ.

5.00 අනන්‍යතාව තහවුරු කිරීම :-

ජාතික හැඳුනුම්පත/ තැපැල් හැඳුනුම්පත හෝ විදුහල්පති විසින් සහතික කරන ලද ඡායාරූපයක් මගින් හෝ අනන්‍යතාව තහවුරු කළ යුතුය.

6.00 තරඟ අවස්ථා:- මෙම තරගය මූලික වටය, දෙවන වටය හා අවසාන වටය යනුවෙන් වට තුනකින් සමන්විතය.

6.01 මූලික වටය:- මෙම වටය දිස්ත්‍රික්ක මට්ටමෙන් පැවැත්වේ. පළාතට අයත් අධ්‍යාපන කොට්ඨාශ තුළ මෙම තරග වටය පවත්වා එක් එක් ශීර්ෂය යටතේ පළමුවැනි ස්ථානය දිනා ගන්නා තරගකරු/කණ්ඩායම පමණක් තෝරා දෙවැනි වටයට ඉදිරිපත් කිරීමේ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ. මෙම වටයේ තරඟ 1993 ...... පෙර පවත්වා අවසන් කළ යුතුයි.

## පළමු වටයේ තරග පැවැත්වෙන දිස්ත්‍රික්ක නාමාවලිය

1 කොළඹ/හෝමාගම
2 ගම්පහ/මිනුවන්ගොඩ
3 කලුතර
4 ගාල්ල
5 මාතර
6 තංගල්ල
7 මොනරාගල/අම්පාර
8 පොලොන්නරුව
9 අනුරාධපුරය
10 ත්‍රි. මලේ
11 පුත්තලම/ හලාවත
12 කුලියාපිටිය / නිකවැරටිය
13 කුරුණෑගල
14 මාතලේ
15 මහනුවර
16 නුවරඑළිය
17 බණ්ඩාරවෙල
18 රත්නපුරය
19 කෑගල්ල

6.02 දෙවැනි වටය:-

පළාත් මට්ටමින් පැවැත්වෙන මෙම තරඟ වටය මූලික වටයේ තරඟවලින් ජයග්‍රහණය ලැබූ පාසල් අතර වේ. සංවිධාන කිරීමේ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ. මෙම වටයේ තරඟයේදී ඒ ඒ ශීර්ෂය යටතේ පළමුවැනි ස්ථානය දිනාගත් පාසල්වලට පමණක් අවසාන වටයට ඇතුළත් වීමේ හිමිකම් ලැබේ. මෙම වටයේ 1993...... දිනට පෙර පවත්වා අවසන් කළ යුතුය.

6.03 අවසාන වටය:-

තෙවැනි වටයේ සුදුසුකම් ලබන පාසල් අතර පැවැත්වෙන අවසාන තරග වටය මෙම අමාත්‍යාංශයේ සංවිධානත්වයෙන් කොළඹට නුදුරුව පිහිටි මධ්‍යස්ථාන කිහිපයකදී පැවැත්වෙනු ඇත. අවසන් වටයේ තරග 1993.... පැවැත්වීමට සැලසුම් කර ඇත. අවසන් වටයේ තරගවලට සහභාගීවන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඔවුන් සමඟ පැමිණෙන දෙමාපියන්ට හා ගුරුවරුන්ට නවාතැන් පහසුකම් මෙම අමාත්‍යාංශය මගින් සපයනු ඇත.

6.04 විනිශ්චය:-

පළමු වටයේ තරඟ විනිශ්චය සඳහා විනිශ්චය කරුවන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සංවිධානය කරගත යුතුය. දෙවන හා තෙවන වට සඳහා විනිශ්චයකරුවන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කර ඇත.

7.00 ගෙවීම්

7.1 අවසාන තරගයට සහභාගීවන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මුදල් රෙගුලාසිවලට අනුව ගමන් වියදම් (මගම ගාස්තු) හිමිය. ඔවුන් මෙම අමාත්‍යාංශය මගින් නවාතැන් පහසුකම් සලසා ඇති ස්ථානවල නවාතැන් ගත් විට පමණක් ඊට අමතරව දුර ප්‍රමාණය අනුව දින 05ක උපරිමයකට යටත්ව එක් අයකුට දීමනාව රු. 22.50 බැගින් ගෙවීමක් ද කරනු ලැබේ.

7.2 මෙහි පහත 8.00 ඡේදයේ පරිදි අවසාන තරඟ ප්‍රසංග සඳහා සහභාගීවන ගුරු මහත්ම/ මහත්මීන්ට ගමන් වියදම්, යැපීම් දීමනා ගෙවනු ලැබේ.

7.03 සමූහ ගායන / වාදන ප්‍රසංග, නාට්‍ය හා මුද්‍රා නාට්‍ය තරග සඳහා පැමිණෙන විද්‍යාල කණ්ඩායම් දුම්රියෙන් ගමන් නොකරන්නේ නම් එම කණ්ඩායම්වලට පමණක් අදාළ විද්‍යාලයේ සිට තරග මධ්‍යස්ථානය දක්වා යාම් - ඊම් සඳහා ම.ග.ම ගාස්තුවලට අනුකූලව ගමන් ගාස්තු ගෙවනු ලැබේ. මෙම අනුග්‍රහය ලබා ගැනීම සඳහා සංගීත, නැටුම් ප්‍රධාන අධ්‍යාපන නිලධාරියාගේ/අධ්‍යාපන නිලධාරියාගේ හෝ සාමාන්‍ය අධ්‍යාපන නිලධාරියාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුය. වියදම් ප්‍රතිපූර්ණය සඳහා වවුචරයට එම ලිපිය අමුණා යැවිය යුතුය.

7.04 සියළුම වවුචර/ ගමන් වියදම් ඉල්ලුම්පත් ඒ ඒ තරග අවසන් වී සති දෙකක් ඇතුළත විද්‍යාලය අයිති පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

8.00 කණ්ඩායම් භාරකාරත්වය

පහත සඳහන් නියමයන් යටතේ යොදාගනු ලබන ගුරු මහත්ම / මහත්මීන්ට පමණක් ගමන් ගාස්තු හා යැපීම් දීමනා ගෙවනු ලැබේ. මෙම ගුරු මහත්ම / මහත්මීන්ගේ සහභාගීත්වය විදුහල්පති විසින් අනුමත කළයුතුය.

8.01 ශිෂ්‍යාවන්ගේ භාරකාරත්වය ගුරු මහත්මීන්ටද, ශිෂ්‍යයන්ගේ භාරකාරත්වය ගුරු මහතුන්ටද පැවරිය යුතුවෙයි. ශිෂ්‍ය / ශිෂ්‍යාවන් දෙපිරිසම සහභාගී වන විට ගුරු මහත්ම මහත්මීන් යන දෙ පිරිසම භාරකාරත්වය දැරිය යුතුවේ. ශිෂ්‍යාවන් පමණක් තරගයට සහභාගී වන විට සහාය වාදනය / ගායනය කරනු ලබන්නේ ශිෂ්‍යයකු හෝ ගුරු මහතකු හෝ විසින් නම් ශිෂ්‍යාවට ගුරු මහත්මීන්ගේ භාරකාරත්වය අනිවාර්ය වේ.

8.02 කණ්ඩායම් භාරකාරත්වය 1-20 දක්වා ගුරු භවතුන් දෙදෙනෙකුද, කණ්ඩායම් 21 - 30 දක්වා ගුරු භවතුන් තිදෙනෙකු ද, කණ්ඩායම් 31 ට වැඩි නම් ගුරු භවතුන් අතර දෙදෙනෙකු ද යොදනා ගත හැකිය. ඊට අමතරව යොදවා ගන්නා ගුරු භවතුන්ට ගෙවීම් කරනු නොලැබේ.

# උපලේඛනය - 1

## සමස්ත ලංකා පාසල් සංගීත නාට්‍ය තරගය - 1993

තරග ශීර්ෂ

1.00 ප්‍රාථමික

1.01. ඒකල ගායනය - ගැහැණු
1.02. ඒකල ගායනය - පිරිමි
"මගේ පාසල" තේමාව යටතේ නිර්මාණය කළ, ප්‍රාථමික අංශයට උචිත ගීතයක්
1.03. සමූහ ගායනය - ගැහැණු
1.04. සමූහ ගාහනය - පිරිමි
1.05. සමූහ ගායනය - මිශ්‍ර
"බැති ගී" සාම්ප්‍රදායික .නාද මාලා විය යුතුය.
1.06. නාඩ්‍ය තූර්ය සංවාදන - ගැහැණු
1.07. නාඩ්‍ය තූර්ය සංවාදන - පිරිමි
1.08. නාඩ්‍ය තූර්ය සංවාදන - මිශ්‍ර

නාඩ්‍ය තූර්ය සංවාදන සකස් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

i. විවිධ තිත් රූපවලට අයත් පද වාදනය අපේක්ෂා කෙරේ.
ii. ඒ ඒ තිත් රූපවලට ගැලපෙන නාද මාලා වැයිය යුතුය.
iii. නැටුම් අංග නොවන ඉතා සරල රිද්මානුකූල අංග චලන අපේක්ෂිතය.
iv. තිත් රූප හා නාද මාලාව වාදනය සඳහා ස්වදේශීය සාම්ප්‍රදායික හා ආදේශ භාණ්ඩ භාවිතා කළ හැකිය.
v. නාද මාලාව වැයීම අදාල තරග කණ්ඩායමේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින්ම කළ යුතුය.
vi. දනට භාවිතා වන හේවිසි හා බටහිර තූර්ය වාදන (බෑන්ඩ්) රටාවම නොවිය යුතුය.

2.00 කණිෂ්ඨ

2.01 ඒකල ගායනය - ගැහැණු
2.02 ඒකල ගායනය - පිරිමි
"පද්මාවතී" නූර්තියෙන් ගීතයක් / දෙකක්
2.03 ඒකල වාදනය - ගැහැණු
2.04 ඒකල වාදනය - පිරිමි
රාගය - යමන් මධ්‍යලය වාදනයක් වයලින්, එස්රාජ්, සිතාර්, බටනාලා යන සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ හැකිය.
2.05 සමූහ ගායනය - ගැහැණු
2.06 සමූහ ගායනය - පිරිමි
2.07 සමූහ ගායනය - මිශ්‍ර

"ජන ගී" මෙම ප්‍රසංගයේදී නෙළුම්, ගොයම්. කමත්, කුරහන් යන ගී වර්ග මිශ්‍රව හෝ එක් වර්ගයක් හෝ යොදා ගත හැකිය. සාම්ප්‍රදායික නාද මාලාවන්ගෙන් බැහැර නොවිය යුතුය. උචිත ස්වර වාද්‍ය භාණ්ඩ යොදා ගැනීමේ නිදහස ඇත. තාල වාදනය සාම්ප්‍රදායික භාණ්ඩ අනිවාර්යයෙන් යොදා ගත යුතුය.

ඒකල හා යුගල ගායන වාදන දෙකොටසකින් යුක්තය.
"අ" - කොටස 9, 10, 11 වසර සිසුන් සඳහා
"ආ" - කොටස 12, 13 වසර සිසුන් සඳහා

3.01 ඒකල ගායනය - 'අ' කොටස - ගැහැණු
3.02 ඒකල ගායනය - 'අ' කොටස - පිරිමි
(රාගය - භෛරවි - සිංහල බසින් රචිත මධ්‍යලය ගීතයක්)
3.03 ඒකල ගායනය - 'ආ' කොටස - ගැහැණු
3.04 ඒකල ගායනය - 'ආ' කොටස - පිරිමි
(රාගය- මාලකවුන්ස් - සිංහල බසින් රචිත මධ්‍යලය ගීතයක්)
3.05 ඒකල වාදනය - 'අ' කොටස - ගැහැණු
3.06 ඒකල වාදනය - 'අ' කොටස - පිරිමි
ඒකල ආසාවරී - මධ්‍යලය ගීතයක් හෝ වාදිතයක්
3.07 ඒකල වාදනය - 'ආ' කොටස - ගැහැණු
3.08 ඒකල වාදනය - 'අ' කොටස - පිරිමි
(රාගය - බෘන්දාමනී සාරංග මධ්‍යලය ගීතයක් හෝ වාදනයක්)

සැ. යු. - 3.05, 3.06, 3.07 සහ 3.08 සඳහා වයලීන්, එස්රාජ්, සිතාර් සහ බටනලා යන සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ හැකිය.

3.09 ඒකල වාදනය - තබ්ලා - 'අ' කොටස - ගැහැණු
3.10 ඒකල වාදනය - තබ්ලා - 'අ' කොටස- පිරිමි
3.11 ඒකල වාදනය - තබ්ලා - 'ආ' කොටස - ගැහැණු
3.12 ඒකල වාදනය - තබ්ලා - 'ඇ' කොටස - පිරිමි
තාලය - ත්‍රිතාල් - මෙහි 'අ' සහ 'ආ' දෙකොටසටම යෙදේ.
3.13 යුගල වාදනය - 'අ' කොටස - ගැහැණු
3.14 යුගල වාදනය - 'අ' කොටස - පිරිමි
3.15 යුගල වාදනය - 'අ' කොටස - මිශ්‍ර
රාගය - බිලාවල්
3.16 යුගල වාදන - 'ආ' කොටස - ගැහැණු
3.17 යුගල වාදන - 'ආ' කොටස - පිරිමි
3.18 යුගල වාදන - 'ආ' කොටස - මිශ්‍ර
රාගය - කුමාජ්

'අ' සහ 'ආ' ප්‍රසංගවලදී වාදකයින් දෙදෙනාටම වාදන කොටස් බෙදී යා යුතුය. යුගල වාදන අනුගමනය කළ යුතුය. පහත දක්වෙන යුගල වාදන කට්ටල අනුව ප්‍රසංග ඉදිරිපත් කළ යුතුය.

(1) වයලීන් - බටනලා (2) වයලීන් - සිතාර්
(3) සිතාර් - බටනලා (4) සිතාර් - එස්රාජ්

3.19 සමූහ ගායනා - ජන ගී - ගැහැණු
3.20 සමූහ ගායනා - ජන ගී - පිරිමි
3.21 සමූහ ගායනා - ජන ගී - මිශ්‍ර

"ප්‍රශස්ති" සාම්ප්‍රදායික නාද මාලා සුරක්ෂිත විය යුතුය. සමූහ ගායනා අංග භාවිත කළ යුතුය.

3.22 සමූහ ගායනා - රාගධාරී - ගැහැණු

3.23 සමූහ ගායනා - රාගධාරී - පිරිමි

3.24 සමූහ ගායනා - රාගධාරී - මිශ්‍ර

සිංහල බසින් රචිත මධ්‍යලය ගීතයක්.

4.00 විවෘත අංශය (සමූහ වාදන)

තේමාව - කණාටුව

I වර්ගය - පිරිස 7 - 14 දක්වා

4.01 - ගැහැණු
4.02 - පිරිමි
4.03 - මිශ්‍ර

II වර්ගය - පිරිස 15 - 30 දක්වා

4.04 - ගැහැණු
4.05 - පිරිමි
4.06 - මිශ්‍ර

ඉහත සඳහන් I වර්ගය හා II වර්ගය යන ප්‍රසංග අංක 02 සඳහා සංගීත භාණ්ඩ වර්ගවල සීමාවක් නැත.

III වර්ගය - පිරිස 10 - 30 දක්වා

4.07 - ගැහැණු
4.08 - පිරිමි
4.09 - මිශ්‍ර

මෙම ප්‍රසංගය සඳහා අවනද්ධ භාණ්ඩ හා විශේෂයෙන් නිර්මාණය කළ ආදේශ සංගීත භාණ්ඩ යොදා ගත යුතුයි.

සැ.යු.:- "කුණාටුව" තේමාව වාදනයෙන් ප්‍රකාශ විය යුතුය. සියලු සංධවනි හා විශේෂ වර්ගයේ වාදනවල අදහස කියවෙන සාරාංශ සටහනක් තරග අංක ඉදිරිපත් කිරීමට පෙර සංවිධානයට භාර දිය යුතුවේ.

4.10 සමූහ වාදන - රාගධාරී - ගැහැණු

4.11 සමූහ වාදන - රාගධාරී - පිරිමි

4.12 සමූහ වාදන - රාගධාරී - මිශ්‍ර

රාගය - පාලි

5.00 නාට්‍ය තරග ශීර්ෂ

5.01 - සාමාන්‍ය නාට්‍ය

ගීත නාට්‍ය, නෘත්‍ය, නාටක හා මුද්‍රා නාට්‍ය ගණයට අයත් නොවන අනෙක් නාට්‍ය ශෛලි මේ වර්ගයෙහි ලා ගැනේ.

දෙබස් ප්‍රධාන වේ. අවශ්‍ය තැන පමණක් නාද සංයෝජනය හෝ ගීත හෝ උපයෝගී කර ගත හැකිය. ස්වාභාවික ශෛලිය, අර්ධ ශෛලියක විකාර රූප හෝ පර්යේෂණාත්මක නවරංග ශෛලි වුද මේ වර්ගයෙහිලා ගැනේ. අවශ්‍ය නම් පමණක් චාම් ලෙස වේදිකා සැරසිලි යොදා ගැනීමට ඉඩ ඇත.

5.02 - ගීත නාට්‍ය

නාට්‍ය විකාශනය වනුයේ හුදෙක් ගීතයෙන් විය යුතුය. සෑම ගීතයක්ම නළු, නිළියන් විසින්ම ගායනා කළ යුතුය. අත්වැල් ගායනයට ඉඩ ඇත. ගායන කණ්ඩායම් වේදිකාවේ අසුන් ගත යුතුය. විචිත්‍රත්වය සඳහා අතරින් පතර ගද්‍යමය කොටස් ස්තර රටාවකට ගැයිය හැකිය. සොකරි, කෝලම්, නාඩගම් හා නූර්ති නාට්‍ය ශෛලීන් ඇසුරු කිරීමට නිදහස ඇතත් ඒවාට අනුකරණය නොවිය යුතුය.

නාට්‍ය තේමාව

ආගම්, ජාති, කුල භේදවලට හෝ දේශපාලන භේදවලට තුඩු නොදෙන, පාසල් සිසුන්ට උචිත සුදුසු තේමාවක් යොදාගත හැකිය.

## 6.00 - සංගීත හා නාට්‍ය ප්‍රසංග සඳහා නියමිත කාලය

ප්‍රාථමික අංශය

6.01 ඒකල ප්‍රසංග - අවම විනාඩි 03 - උපරිම විනාඩි 05
6.02 ඒකල ප්‍රසංග - අවම විනාඩි 04 - උපරිම විනාඩි 06

කණිෂ්ඨ අංශය

6.03 ඒකල ප්‍රසංග - අවම විනාඩි 04 - උපරිම විනාඩි 06
6.04 ඒකල ප්‍රසංග - අවම විනාඩි 04 - උපරිම විනාඩි 06

ජ්‍යෙෂ්ඨ අංශය

6.05 ඒකල හා යුගල ප්‍රසංග - අවම විනාඩි 05 - උපරිම විනාඩි 07
6.06 සමූහ ප්‍රසංග - අවම විනාඩි 05 - උපරිම විනාඩි 07
6.07 විවෘත ප්‍රසංග - අවම විනාඩි 06 - උපරිම විනාඩි 08
6.08 නාට්‍ය ප්‍රසංග - අවම විනාඩි 25 - උපරිම විනාඩි 30

7.00 - සහභාගී වියහැකි සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 7.01 | ඒකල ගායන වාදන සඳහා | - උපරිම 05 යි (සහාය වාදනය ඇතුළුව) |
| 7.02 | යුගල වාදන සඳහා | - උපරිම 07 යි (සහාය වාදනය ඇතුළුව) |
| 7.03 | සමූහ ගායනය | - වාදන මණ්ඩල හැර අවම 15 යි<br>- වාදන මණ්ඩල ඇතුළුව උපරිම 30 යි |
| 7.04 | නාට්‍ය සඳහා | - ගායන වාදන කණ්ඩායම් ඇතුළුව - උපරිම 30 |
| 7.05 | කාව්‍ය තූර්ය වාදන සඳහා | - අවම 15, උපරිම 30 විවෘත සමූහ වාදන ප්‍රසංග සඳහා |
| 7.06 | I වර්ගය | - අවම 07 - උපරිම 14 |
| 7.07 | II වර්ගය | - අවම 15 - උපරිම 30 |
| 7.08 | III වර්ගය (විශේෂ) | - අවම 10 - උපරිම 30 |

## උපලේඛනය - II

### සමස්ත ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 1993

(මෙහි දක්වෙන මිශ්‍ර නැටුම් ප්‍රසංගය සඳහා ගැහැණු / පිරිමි ගණන සමාන විය යුතුය)

**තරග ශීර්ෂ**

8.00 - ප්‍රාථමික අංශය

8.01 සමූහ නැටුම් - ගැහැණු
8.02 සමූහ නැටුම් - පිරිමි
8.03 සමූහ නැටුම් - මිශ්‍ර
(ඔළිඳ කෙළිය)

9.00 - කණිෂ්ඨ අංශය

ඒකල නැටුම් - උඩරට
9.01 ගැහැණු - වෛරෝඩි වන්නම
9.02 පිරිමි - නෛයියඩි වන්නම

ඒකල නැටුම් - පහත රට
9.03 ගැහැණු - යහන් දක්ම
9.04 පිරිමි - වඩිග පටුන

ඒකල නැටුම් - සබරගමු
9.05 ගැහැණු - ගටන් මාත්‍රය
9.06 පිරිමි - මුල් මාත්‍රය

සමූහ නැටුම් - උඩරට
9.07 ගැහැණු - උකුසා වන්නම
9.08 පිරිමි - සැවුලා වන්නම
9.09 මිශ්‍ර - සූරපති වන්නම

සමූහ නැටුම් - පහතරට
9.10 ගැහැණු - ගිරිදේවි නැටුම
9.11 පිරිමි - මඟුල් රාගය
9.12 මිශ්‍ර - ගෙජ්ජි මාත්‍රය

සමූහ නැටුම් - සබරගමු
9.13 ගැහැණු - කදම්භ පක්ෂි වන්නම
9.14 පිරිමි - කෝකිල වන්නම (කොහොවියනා හඬ)
9.15 මිශ්‍ර - ආනන්ද වන්නම (ගම්භීරන් තාලෙට)

ගැමි නැටුම්
9.16 ගැහැණු - කළගෙඩි නැටුම
9.17 පිරිමි - කාලම් නැටුම
9.18 මිශ්‍ර - රබන් නැටුම (රබන් කරකැවීම නොව)

මුද්‍රා නාට්‍ය
9.19 මුද්‍රා නාට්‍ය මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශවන ආගම්, ජාති, කුල භේදවලට හෝ දේශපාලන භේදවලට තුඩු නොදෙන කැමති තේමාවක් තෝරාගත හැකිය.

**10.00 ජ්‍යෙෂ්ඨ අංශය**
**'ආ' කොටස** - වසර 9, 10, 11 සිසුන් සඳහා

**ඒකල නැටුම්** - උඩරට
10.01 - ගැහැණු - බුලත් පදය
10.02 - පිරිමි - පොල් පදය

**ඒකල නැටුම්** - පහතරට
10.03 - ගැහැණු - පත්තිනි පද
10.04 - පිරිමි - සුද්ධ මාත්‍රය

**ඒකල නැටුම්** - සබරගමු
10.05 - ගැහැණු - දළුමුර පාලිය (පදය සමග)
10.06 - පිරිමි - යක් පද මාත්‍රය

**ඒකල** බෙර වාදන - උඩරට
10.07 - ගැහැණු - මඟුල්බෙර - (ගැටබෙර)
10.08 - පිරිමි - මඟුල්බෙර - (ගැටබෙර)

**ඒකල** බෙර වාදන - පහතරට
10.09 - ගැහැණු - මඟුල් බෙර - (පහතරට බෙර)
10.10 - පිරිමි - මඟුල් බෙර - (පහතරට බෙර)

ඒකල බෙර වාදන - සබරගමු
10.11 - ගැහැණු - මංගල දවුල් වාදනය - (මඟුල් බෙර)
10.12 - පිරිමි - මංගල දවුල් වාදනය - (මඟුල් බෙර)

ඒකල තම්මැට්ටම් වාදනය
10.13 - පිරිමි - හැන්දෑදුරය සහ තනි තිතට අයත් අලංකාර පද වාදනය (සහාය සඳහා දවුල් හෝ කාලම්පට යොදාගත හැකිය)

ඒකල නැටුම් - උඩරට
10.14 - ගැහැණු - කොතල පදය
10.15 - පිරිමි - යක් ඇන්නුම

ඒකල නැටුම් - පහතරට
10.16 - ගැහැණු - සළු පදය
10.17 - පිරිමි - නාග රාක්ෂ

ඒකල නැටුම් - සබරගමු
10.18 - ගැහැණු - මණ්ඩූක වන්නම
10.19 - පිරිමි - ධූප පාලිය (පදය සහිත)

ඒකල බෙර වාදනය - උඩරට
10.20 - ගැහැණු - දොංක පහට අයත් පද අලංකාර සහිතව
10.21 - පිරිමි - අත්‍යා බෙර (තිත් රූප තුනකට)

ඒකල බෙර වාදනය - පහතරට
10.22 - ගැහැණු - වැඳුම් අත් - (වන්දමානව්)
10.23 - පිරිමි - වැඳුම් අත් - (වන්දමානව්)

ඒකල බෙර වාදනය - සබරගමු
10.24 - ගැහැණු - දකුම් අත් වාදනය
10.25 - පිරිමි - වන්දමානව් (වැඳුම් අත්)

ඒකල තම්මැට්ටම් වාදනය

10.26 - පිරිමි - තේවා හේවිසි පද හා තුන් තිතට අයත් අලංකාර පද වාදනය (සහාය සඳහා දවුල හෝ තාලම්පට යොදා ගත හැකිය)

සමූහ නැටුම් - උඩරට

10.27 - ගැහැණු - අස්නෙ නැටුම
10.28 - පිරිමි - කොහොඹා හැල්ල
10.29 - මිශ්‍ර - උඩැක්කි, පන්තේරු (මේ වර්ග දෙකට මිශ්‍රව ප්‍රසංග අංකය සාදා ගත හැකිය)

සමූහ නැටුම් - පහතරට

10.30 - ගැහැණු - සුරඹ වල්ලි
10.31 - පිරිමි - දෙවොල්
10.32 - මිශ්‍ර - පන්දම් පද

සමූහ නැටුම් සබරගමු

10.33 - ගැහණු - සින්දු මාත්‍රය
10.34 - පිරිමි - පට්ටුතාල මාත්‍රය
10.35 - මිශ්‍ර - පන්දම් පද

ගැමි නැටුම්

10.36 - ගැහැණු - චාමර නැටුම
10.37 - පිරිමි - කඩු සරඹ
10.38 - මිශ්‍ර - ගොයම් නැටුම

නාට්‍යමය අවස්ථා නිරූපනය

10.39 - උඩරට
10.40 - පහතරට
10.41 - සබරගමු

(මේ ප්‍රසංග අංකය සඳහා උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්මවල එන නාට්‍යමය අවස්ථා නිරූපනය කෙරේ.)

මුද්‍රා නාට්‍ය

10.42 - ගැහැණු
10.43 - පිරිමි
10.44 මිශ්‍ර

මුද්‍රා නාට්‍ය මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශ වන ආගම්, ජාති, කුල භේදවලට හෝ දේශපාලන භේදවලට තුඩු නොදෙන කැමති තේමාවක් තෝරාගත හැකිය.

11.0 විවෘත අංශය (බෙර සංධවනී)

තේමාව "ඇසල පෙරහැර"

11.01 - ගැහැණු
11.02 - පිරිමි
11.03 - මිශ්‍ර

"ඇසල පෙරහැර" තේමා කොට, නිර්මාණය කළ බෙර සංධවනියක් මේ යටතේ අපේක්ෂා කෙරේ. ඇසල පෙරහැරේ තිබෙන විවිධ අංග, බෙර නාද තුලින් උද්දීපනය විය යුතුය. මෙම ප්‍රසංගයේදී නැටුමට නොව වාදනයට ප්‍රමුඛත්වය හිමිවේ.

12.0 නැටුම් හා මුද්‍රා නාට්‍ය ප්‍රසංග සඳහා නියමිත කාලය

ප්‍රාථමික
12.01 ඒකල - අවම වි. 3 - උපරිම වි. 5
12.02 සමූහ - අවම වි. 4 - උපරිම වි. 6

කනිෂ්ඨ
12.03 - ඒකල - අවම වි. 4 - උපරිම වි. 6
12.04 - සමූහ - අවම වි. 4 - උපරිම වි. 6
12.05 - මුද්‍රා නාට්‍ය - අවම වි. 15 - උපරිම වි. 20

ජ්‍යෙෂ්ඨ
12.06 - ඒකල - අවම වි. 5 - උපරිම වි. 7
12.07 - සමූහ - අවම වි. 5 - උපරිම වි. 7
12.08 - මුද්‍රා නාට්‍ය - අවම වි. 25 - උපරිම වි. 30

13.0 විවෘත සංධවනී

13.01 - අවම කාලය - වි. 8 - උපරිම වි. 10

14.0 සහභාගී විය හැකි සංඛ්‍යාව:

14.01 - ඒකල නැටුම් / ඒකල වාදන - (සහාය වාදන ඇතුළුව) උපරිම 05 යි.

සමූහ නැටුම් :
14.02 - (සහායකයින් හැර) අවම 6 යි.
(සහායකයින් සමඟ) උපරිම 25 යි.

මුද්‍රා නාට්‍ය:-
14.03 - ගායන/වාදන කණ්ඩායම් ඇතුළුව උපරිම 30 යි. අවම 12 යි.

විවෘත බෙර සංධවනී:
සහභාගී විය හැකි සංඛ්‍යාව අවම 10 යි. උපරිම 30 යි. (මිශ්‍ර) නැටුම් ප්‍රසංග සඳහා අවම වශයෙන් ළමයින් 6 දෙනෙකුවත් සහභාගී විය යුතු අතර, ගැහැණු - පිරිමි ගණන සමාන විය යුතුය. තරඟ මාලාව සාර්ථක ලෙස සංවිධානය කොට පැවැත්වීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගේ කොට සලකමි.